### මේ අවදානම නොගන්න

දියුණු සමාජයක මිනිස් ජීවිත වලට වටිනාකමක් තියෙනවා. ඒ නිසාම ඒවා රැක ගන්න විවිධ නීති රීති පද්ධති තියෙනවා. ඒ නීති වලට අනුව හැඩ ගැහීම හා ඒවා පිළිපැදීම සමාජයේ පුද්ගලයින් සතු වගකීමක් සේම යුතුකමක්. මන්ද තමන්ගේ ක්‍රියාව අනුන්ගේ ජීවිත වලට බලපෑමක් කළ හැකි නිසා.

සඥා පුවරු තියෙන්නෙ නීතියක් සමාජයට ප්‍රායෝගිකව බද්ධ කරන්න යොදාගන්නා මෙවළමක්. ඒවා විවිධ ආකාරයෙන් සමාජය දැනුම්වත් කරන්න යොදා ගන්නවා. අනතුරු අඟවන දැන්වීම් අවවාදාත්මක දැන්වීම් ලෙසින් ඒවා ඔබත් දැක ඇති. මතුපිටින් බො-




හොම සරළ දෙයක් ලෙස පෙනුණත් ඒවා නොතකා හැරීම ඔබේ ජීවිත වලට බරපතළ ලෙස ප්‍රතිවිපාක ගෙන දෙන සිද්ධීන් වලට තුඩු දෙන්න පුලුවන්.

මෙච්චර කතන්දරයක් චූටි මල්ලි මේ බෝඩ් ගැන කිව්වේ නැවත වතාවක් අපේ සමාජයේ ජීවත් වූ අපේම කෙනෙකුට සිදුවූ අනතුරක් නිසායි. මම නම් මේක ලියන්නේ යමක් කරන-කොට යළි යළිත් තමන් කරන දේ ගැන හිතන්න පුරුදු කරන්න ඕනෙ නිසයි. අපේ සමාජයේ මිනිස්සු හැම තිස්සෙම බලන්නෙ පෙන්වන හඳ දිහා නෙවෙයි ඇඟිල්ල දිහාමයි.

ගිය සතියේ දියේ ගිලීමෙන් මිය ගිය ශ්‍රී ලාංකිකයාගේ සිද්ධිය ගැන නොලියා සිටින්නට මගේ සිත මට ඉඩ දෙන්නෙ නැහැ. මිනිස්සු මුහුදට ආසයි. ඒකෙ බැහැල නාන්න ආසයි. ඒක අපේ ජීවිතයට බොහොම සමීප දෙයක්. ඒත් අර ටෙලිවල චිත්‍රපට වල තියෙනවා වගේ ජීවිතයත් මුහුද වගේ තේරුම් ගන්න බැහැ කියන කතාව ඇත්ත තමයි. ඒකෙ ස්වභාවය තේරුම්ගන්න බැහැ. ඒක නිසා අපි හැම තිස්සෙම ඇලට් එකෙන් ඉන්න ඕනෙ. පනින්න පෙර සිතා බලන්න ඕනෙ. නැත්නම් අවසන් ප්‍රතිඵලය ඉතාමක් කණගාටුදායකයි. ඒකයි මම මුලින්ම කිව්වෙ. තනි පුද්ගලයෙකුගෙ ක්‍රියාව තවත් දෙතුන් දෙනෙකුගෙ ජීවිත වලට බොහොම බලපෑම්ක් කරනවා කියලා.

කිසිම වෙලාවක ජීවිතය පිළිබඳ අවදානමක් ගන්න එපා හිතවතුනි. අනතුරක් සිදුවෙන්නට යන්නේ තත්පරයකටත් අඩු කාලයක් බව හැමවිටම හිතන්න. ජීවිතයක් කොයි තරම් වටිනවද. අර මහා අවදානම අරගෙන ගන්න සතුටට වඩා ජීවිතයක් කෝටි ප්‍රකෝටි වාරයක් වටිනවා කියන එක හැම විටම කල්පනා කරන්න.

අවසන් වශයෙන් කියන්නේ මේක ලිව්වෙ බොහොම දුකෙන් සද්භාවයෙන්. මේක ගැන හිතන එක තනියෙන්ම නොව සමාජයක් ලෙසම කළ යුතු දෙයක්.

### ඇවිල් ඇවිල්ලා සිංහල අවුරුද්ද ඇවිල්ලා

අවුරුද්ද ආපහුඇවිත් වෙනදා වගේම. අපි මොනවද කරන්නෙ? පෙර සේමයි කිරි බතක් හදාගෙන කනවා කේක් එක්ක. හවසට කොහේ හරි සෙට් වෙලා බොනවා. ටෙක් එකේ අවුරුදු උත්සවයට යනවා. පොඩි ආතල් එකක් අරන්



සළුදාට වැඩට යනවා. කාලෙකට පෙර තිබුණ ලංකාවෙන් අරන් ආපු හිත මිතුරන්ට කෑම පිඟන් යවපු ගෙදරට කතා කරලා කෑම වේලක් දීපු පුරුදුත් දැන් ක්ෂය වෙලා ගිහින්. අවුරුද්ද කියන සංකල්පයම දැන් අතුරුදන් වෙලා වගේ.

අනේ අම්මපා අපේ පරම්පරාවටත් යමින් තියෙන කල. අපි මොන තරම් වෙනස් වෙලාද? යාන්ත්‍රික වෙලා කියන එකේ උපරිමය.

අපි ජීවත් වෙන්නේ තනිකරම ටාගට් මත වගේ . හැමෝටම විවිධ ඉලක්ක. අපට වගේම අපිට කලින් මෙහි ආපු හැම කෙනෙකුටම ගෙයක් දොරක් රැකියාවක් වාහන දෙක තුනක් ඉන්වෙස්ට්මන්ට් දෙක තුනක් හෝ අමතර ආදායම් මාර්ගයක් තිබිලත් අපි තෘප්තිමත්ද?


අපි ලංකාවේදිත් මෙහෙදිත් අමාරුවෙන් හරි රැකගෙන ඉදිරියට අරන් ආපු අපේ සංස්කෘතික ගුණාංග පළපුරුදු සිරිත් චාරිත්‍ර අපට නැතිවෙලා අමතක වෙලා යන්නෙ කො-හොමද? එහෙම වෙන්නෙ ඇයි? ජීවිතය කියන්නෙ එකම තෘෂ්ණාවක් පමණක් කියන එකද?

මේක නම් කල්පනා කරලා බලනකොට සෑහෙන්න බොන්න ඕනෙ ප්‍රශ්නයක් තමයි. අපිට නෙවෙයි. බොන කට්ටියට. කව්ද කිව්ව වගේ අපි දුකෙන් මිදෙන්න මෙහෙ ඇවිල්ල සැප අරගෙන දැන් සැපට දුක් විඳිනවා. සේරම අපේ අක් මුල් ගලවාගෙන. දැන් ජීවිතයේ හැමදාම එක වගේ වෙලා. මේවා හිතනකොට මට හැම තිස්සෙම මතක් වෙන්නෙ බ්ලොග් එකක ලියලා තිබුණ වෙනස් කරපු ජනප්‍රිය ගී පදයක්.

කොහෝ කොහෝ ගහේ ඉඳන්
මොන රෙද්දට කොහෝ කියනවදෝ?

### සන්සට දහයයි

සන්නසට වසර දහයක් වෙලා. පමා වෙලා හරි පත්තරයට සෙට් වෙන්න ලැබුණ එක භාග්‍යයක්. පත්තර කෙරුවාව ලේසි පහසු කෙළියක් නොවන වග සන්නසේ නිත්‍ය සාමාජිකයන්ගේ කතා බහෙන් තේරෙනවා. පත්තර නම් මෙල්බන් වල ඔය ඕනෙ තරම් තියෙන්නෙ. පත්තරයකින් කරන්න ඕනෙ මිනිස් සුන්ට ආරංචි විස්තර දැනුම විනෝදය දෙන එක විතරක්ද? මේ වගේ රටක මිනිස්සුන්ට පත්තරේකින් කතා කරන්න ඕනෙ මොකක්ද කියන එක ගැන හරි අවබෝධයක් හුඟක් පත්තරවලට නැහැ කියලයි මට නම් හිතෙන්නෙ. රස්සාවක් කරලා කාලා බීලා ඉන්න මිනිස්සුන්ගේ ඔලු වලට විනෝදය සතුට ගේන එකට වඩා ඒ ඔලු ගෙඩි වලට මේ සමාජයේ මිනිස්සු ගැන හිතන්න පතන්න පුරුදු කරන්න උත්සාහයක් ගන්න




එකත් වැදගත් කියලා හිතලා ඒ අනුව වැඩ කරන පත්තරයක් ලෙස සන්නස හඳුන්වන්න මම නම් කැමතියි. සමහර අය කියනවා සන්නසේ තියෙන්නෙම දේශපාලනය කියලා. ඉතින් මොකද? හැම දෙනෙක්ම නොදන්න දේ තමයි අපි කරන කියන හැම දේකම කෙළවර දේශපාලනය තියෙනවා කියන එක.

මට නම් හිතෙන්නේ තව කල් ගිහින් හරි සන්නස කරන්නෙ මොකක්ද කියලා හැමෝ ම තේරුම් ගනීවි. කොහොම වුණත් සන්න-සේ ලයින් එකට මෙහේ අදහස් සමපාත වුණත් නොවුණත් අපට ලියන්න දීලා තියෙන නිදහසට මම බොහෝ ගරු කොට සළකනවා.

සන්නසට තිබුණ තර්ජන දැන් අවසන් වෙලා කියලත් ආරංචියි. අපි ඒවා ගැන හරි හැටි දැන සිටියේ නැහැ. ඉදිරියේ දී සන්නසට වෙන වෙන ඕනෑම ආසාධ-ාරණයකදී අපි නොසැළී ඔබ සමග සිටින බව දන්වන්නේ අභිමානයෙන්. සන්නස ඔබට සුබ ගමන්.

### බක් මහ විරු සමරුව



අප්‍රේල් මාසෙ පස්වෙනිදා කියන්නෙ ලාංකික සමාජයේ සැබෑ වෙනසක් දකින්න ඒ වෙනුවෙන් ප්‍රායෝගිකව කැපවුණ මිනි සුන්ගේ සහ ඒ වෙනස වෙනුවෙන් හීන දැකපු මිනිසුන්ගේ ජීවිත වලට වඩාත්ම වැදගත් දවස විදිහට දකින්න පුලුවන්. අපේ අයියලා ගේ පරපුරත් තාත්තලගේ පරම්පරාවත් ඒ දවස සමරන්නේ බො-හොමත්ම අභිමානයකින්. ප්‍රායෝගිකව ඒ වෙනුවෙන් දායකත්වයක් ප්‍රමාණවත් ලෙස ලබා දීමට නොහැකි වුණත් ඒ දවස සැමරීමේ වගකීම මටත් තියෙනවා තියලා මගේ හිත මට කියනවා. 71 හා 89 ගැන සමාජය තුළ කුමන කතිකාවක් තිබුණත් ඒ



අරගල උදෙසා කැපවුණ ජීවිත පරිත්‍යාග කළ මිනිසුන්ගේ වටිනාකම් අපතේ නොගොස් ඇති බව අද වන විට ඒ ව්‍යාපාර සිටිනා තැන තවමත් ඒ වෙනුවෙන් කෙරෙන සක්‍රිය දායකත්වය දෙස බලන කල පෙනෙනවා. ලෝකයේ කොහේ සිටියත් හැබෑ ලෙසම සාධාරණ සමාජයක් උදෙසා දිවි පිදූ මිනි සුන් හදවතින් හෝ සැමරීම සැබෑ මිනිසුන්ගේ යුතුකමක් ලෙස මම නම් දකිනවා. මෙල්බන් වලත් අප්‍රේල් විරු සමරු දෙකක්ම පැවැත්වෙනවා කියලා දැනගන්න තිබෙනවා. ජවිපෙ හා පෙරටුගාමීන් ලෙසින් පාරවල් දහයකින් හරි යන්නේ එකම තැනකට නම් ප්‍රශ්නයක් නැති වෙයි කියන එකයි මගේ අදහස. ඒකනේ ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ.
ඔහොම යං සහෝ...

### ප්‍රමිතිය කෝ



ඊයේ හවස පීට්සා එකක් ගන්න ගිය වෙලාවෙ හිතට ආව දෙයක් මේ.

ඉස්සර ඕස්ට්‍රේලියාවෙ එක එක වෙළඳ ව්‍යාපාර කෙරුණේ ඒ ඒ ව්‍යාපාර පිළිබඳ විශේෂඥතාවක් ඇති ජාතිකයන් අතිනුයි. හොඳම උදාහරණය පීට්සා. පීට්සා ව්‍යාපාරය කළේ ඉතාලි ජාතිකයන් විසිනුයි. ඒ නිසා ඒ ඒ ව්‍යාපාර තුළ ඔවුන්ගේ අනන්‍යතාවත් රැඳිලා තිබුණා. ව්‍යාපාරයේ ප්‍රමිතියත් ඉතා ඉහළින් රැකුණා.

ඒත් දැන් මේ මෑත කාලෙ ඉඳන් මේ විවිධ ව්‍යා-පාර විවිධ ජාතිකයන් අතට පත්වෙලා. පීට්සා ව්‍යාපාරය පවා විවිධ ආසියාතික ජාතීන් අතට ගිහිල්ලා. ඒ කාලෙ තිබුණ පාරිභෝගික සේවාව - කස්ටමර් සර්විස් එක - විතරක් නෙවෙයි භාණ්ඩ වල ප්‍රමිතියත් බිමටම බැහැලා කියලයි මට පේන්නෙ. විශේෂයෙන් ආසියාතිකයන් අතට පත්ව ඇති ව්‍යාපාර වල මේ තත්වය වැඩියෙන්ම දැක ගන්න පුලුවන්.

දැන් දැන් හොඳ පීට්සා එකක් කන්න ලයිගොන් ස්ට්‍රීට් එකටම යන්න වෙන තත්වයක් තමයි මට පේන්නෙ.

ඔස්ට්‍රේලියානු සමාජය මහා විශාල වේගයකින් වෙනස්වෙමින් තියෙනවා. ඒ වෙනස සිදුවෙන්නෙ හොඳ පැත්තට නෙවෙයි. නරක පැත්තට. ඒකයි දුක.

මං

**චූටි මල්ලි**